# ගුරු - විදුහල්පති වෘත්තීය සමිති සන්ධානය

2021.10.18

මාධ්‍ය සාකච්ඡාව

....................................................
මාධ්‍ය ආයතනය/පුවත්පත
ප්‍රධාන කර්තෘ/සංස්කාරක

**2021.10.21 සහ 22 දිනයන්හි ගුරු විදුහල්පතිවරු වැඩවර්ජනය ස්ථිරයි**

වසර 24 ක් තිස්සේ පවතින ගුරු-විදුහල්පති සේවාවල වැටුප් විෂමතා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සකස්කරන ලද 'සුබෝධනී' වාර්තාව මත පදනම්ව ඉවත් කරන ලෙස ඉල්ලමින් සියලු ගුරු විදුහල්පතිවරු මේ වන විටත් වෘත්තීය ක්‍රියාමාර්ගවල නිරතව සිටින අතර, ඊ ළග ක්‍රියාමාර්ගය ලෙස 2021.10.21 සහ 22 දිනයන්හි ගුරු විදුහල්පතිවරු පාසල්වල සේවයට වාර්තා නොකර වැඩවර්ජනයක නිරත වීමට තීරණය කර ඇත.

මාස 3 කට වැඩි කාලයක් අඛණ්ඩව වෘත්තීය ක්‍රියාමාර්ග පෙරට ගෙන එමින් තිබියදී ගුරු විදුහල්පති වැටුප් ගැටලුවලට විසඳුම් ලබා නොදී කෝවිඩ් 19 වසංගත තත්වය මත වසා දමා ඇති පාසල් අදියර වශයෙන් නැවත විවෘත කිරීමටත්, පළමු අදියර ලෙස සිසුන් 200 ට අඩු පාසල් 2021.10.21 දින විවෘත කිරීමටත් ආණ්ඩුව තීරණය කර ඇත. එම තීරණයට අනුව කටයුතු නොකර සිසුන් 200 ට අඩු පාසල්වල විදුහල්පතිවරු සහ ගුරුවරු 21 දින සහ 22 දින පාසල්වල සේවයට වාර්තා නොකර සිටීමට තීරණය කර ඇත.

අමාත්‍ය මණ්ඩල අනු කමිටුව විසින් යෝජනා කර ඇති, 2018 වසරේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එවකට පැවති වැටුප් කොමිසමට ලබාදුන් වාර්තාවේ ඇතුළත් වැටුප කොටස් 3 ක් යටතේ 2022 සහ 2023 වසර වල ලබාදෙන බව ප්‍රකාශ කර ඇත. එම වැටුප කොටස් වශයෙන් නොව සුභෝධනී වැටුප් යෝජනාවේ පළමු අදියර ලෙස එකවර ලබාදෙන ලෙස ඉල්ලමින් අපගේ වෘත්තීය ක්‍රියාමාර්ග අඛණ්ඩව ඉදිරියට ගෙන යන අතර, නොවැම්බර් 12 වන දින ඉදිරිපත් කිරීමට නියමිත අයවැයෙන් එම වැටුප ලබා දීමට බල කරමින් පහත වෘත්තීය ක්‍රියාමාර්ගවල නිරත වීමට අප තීරණය කර ඇත.
ඒ අනුව,
2021.10.21 දින සහ 22 දින ආරම්භ කරන පාසල්වල ගුරු විදුහල්පතිවරු පාසල්වල රාජකාරියට වාර්තා නොකර වැඩවර්ජනයේ නිරත වීම.
2021.10.25 දින පාසල් ආරම්භ කිරීමෙන් පසු ගුරු විදුහල්පතිවරු දිවයින පුරා උද්ඝෝෂණවල නිතර වීම
2021.11.02 දින ආරම්භ කළ පාසල් ඉදිරිපිට දෙමාපියන් සමග ඒකාබද්ධ උද්ඝෝෂණයක නිරත වීම

ආණ්ඩුව දිගින් දිගටම ගුරු විදුහල්පති වැටුප් ගැටලුවට පිළිගත හැකි විසඳුමක් ලබා නොදෙමින් පාසල් ආරම්භ කිරීමටත්, ආණ්ඩුවේ විවිධ පාර්ශව ලවා ගුරු විදුහල්පතිවරු මර්දනය කිරීමට කටයුතු කිරීමත් හැර වසර 2 කට ආසන්න කාලයක් අහිමිව ඇති පාසල් දරුවන්ගේ අධ්‍යාපනය පවත්වාගෙන යාමට කටයුතු කර නැත. මේ තත්වය තුළ දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳව අවධානය යොමු කර ගුරු විදුහල්පතිවරු ඔක්තෝම්බර් 25 දින පළමු අදියරේ ආරම්භ වන පාසල් වල සේවයට වාර්තා කරන අතර, පාසල් තුළ සිටිමින් වැටුප් ගැටලුවට විසඳුම් ලැබෙන තුරු අඛණ්ඩව වෘත්තීය ක්‍රියාමාර්ග පෙරට ගෙන යන බව ප්‍රකාශ කර සිටිමු. 21 දින ආරම්භ වන්නේ සමස්ත පාසල් සංඛ්‍යාවෙන් සිසුන් 200 ට අඩු පාසල් 3000 ක පමණ ප්‍රමාණයක ප්‍රාථමික ශ්‍රේණි පමණක් වන අතර, ගැටලුවට විසඳුම් ලබා නොදෙන්නේ නම් සියලු පාසල් ආරම්භ කිරීමෙන් පසු වැඩවර්ජන ක්‍රියාමාර්ගවල නිරත වන බව ද වැඩිදුරටත් ප්‍රකාශ කර සිටිමු.
මෙයට

| | | |
|---|---|---|
| ජෝසප් ස්ටාලින් | මහින්ද ජයසිංහ | යල්වෙල පඤ්ඤාසේකර හිමි |
| ලංකා ගුරු සංගමය | ලංකා ගුරුසේවා සංගම | සමස්ත ලංකා එක්සත් ගුරු සංගමය |

ශ්‍රී ලංකා ජාතික විදුහල්පති සංගමය

ශ්‍රේණිධාරී විදුහල්පති සංගම් එකමුතුව

විදුහල්පති සේවා සංගමය



ජගත් ආනන්ද සිල්වා
ස්වාධීන අධ්‍යාපන සේවක සංගමය



සංජීව බණ්ඩාර
ඒකාබද්ධ ගුරු සේවා සංගමය



මයුර සේනානායක
ලංකා ප්‍රගති ගුරු සංගමය



නිර්මාලා ගමගේ
කතෝලික ගුරු සංගමය



ඩබ්.ඩබ්.ජේ.එල්.එච්. රොවෙල්
පුහුණු විද්‍යාපීඨ හා උපාධිධාරී ගුරු සංවිධානය



එන්.බී. චුලරත්න
ලංකා ගෘහ වි. හා කෘෂි වි. ඩිප්ලෝ: සංගමය



එම්.කේ. මොහොමඩ් නියාර්
ශ්‍රී ලංකා ඉස්ලාම් ගුරු සංගමය



පී.එම්. පුංචිහෙට්ටි
ස්වාධීන ලංකා ගුරු සංගමය



මීගහජඳුරේ සීලානන්ද හිමි
ලංකා පිරිවෙන් ගුරු සේවා සංගමය



එස්.ජී.එම්. සමරකෝන්
සමස්ත ලංකා ගුරු උපදේශකවරුන්ගේ සංගමය

ශ්‍රී ලංකා ජාතික ගුරු සංගමය
කඳුරට ගුරු පෙරමුණ
ගුරු විමුක්ති පෙරමුණ
ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ගුරු සංගමය
ශ්‍රී ලංකා අධ්‍යාපන සමාජ සම්මේලනය
වතු ගුරු සංගමය
ජාතික ගුරු සභාව
එක්සත් ද්‍රවිඩ ගුරු සංගමය